පිළියන්දල දැල්තර ප්‍රදේශයේ නිවසක මුදල් ඔට්ටුවට සුදු ක්‍රීඩාවේ නිරතව සිටි පිරිසක් ඇතුළු 11 දෙනෙකු පෙබ. 1, 2023 රාත්‍රියේ දී පොලිසිය විසින් අත්අඩංගුවට ගත් පුවතක්, සිංහල භාෂා පුවත්පත් කිහිපයකම පළ වී තිබුණේ මෙසේය.
* දිනමිණ - "සුවිසල් නිවසේ කාන්තා බුරුපොළක්" (අන්තර්ගතය තුළ: "...ඔට්ටුවට බුරුගසමින් සිටි කාන්තාවන් සිවුදෙනෙකු ඇතුළු පුද්ගලයන් 11 දෙනෙකු අත්අඩංගුවට ගත් බව...")
* මව්බිම - "දැල්තර සුවිසල් නිවෙසේ බුරුපොළ වටලයි, කාන්තාවෝ 4 ක් ඇතුළු 11 ක් අත්අඩංගුවට"
* අද - "සුදු ක්‍රීඩාවේ නිරතව සිටි කාන්තාවන් සිවුදෙනෙකු ඇතුළු 11දෙනෙකු දැලේ"
එසේම, මෙම දිනමිණ, මව්බිම සහ අද පුවත්පත් තුනේම පුවත් වාර්තාවන් ලියා ඇත්තේ එක් ප්‍රාදේශීය වාර්තාකරුවෙකු විසිනි.
ඔබට අනුව,
1) එකම පුවත් වාර්තාකරුවෙකු විසින් ලියූ මෙම පුවත් වාර්තාව තුළ, කොතැනක හෝ මෙය කාන්තාවන් පමණක් සහභාගී වූ සුදු ක්‍රීඩාවක් බව සඳහන්ව නොතිබුණි. එසේ නම්, දිනමිණ සිරස්තලය තුළ පමණක් වටලනු ලැබුවේ "කාන්තා බුරුපොළක්" යනුවෙන් සඳහන් කිරීමේ පදනම කුමක්ද?
2) මෙම සිදුවීම සම්බන්ධයෙන් කාන්තා සැකකාරියන් 4 දෙනෙකු සහ පිරිමි සැකකරුවන් 7 දෙනෙකු අත්අඩංගුවට ගැනී ඇති බව පුවත් වාර්තාවේ දැක්වේ. එසේ නම්, මෙම පුවත්පත් තුනෙහිම පුවත් වාර්තාවන් තුළ, කාන්තාවන් පමණක් ඉස්මතු කොට දැක්වී ඇත්තේ මන්ද?
3) එකම වරදක් සම්බන්ධයෙන් කාන්තාවන් පමණක් සෘණාත්මකව ඉස්මතු කිරීම, ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාව කොන් කිරීමක් නොවන්නේ ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye




subscriber කෙනෙකු වන්න!